# හදවතක සෙර්නාඩ්



ඉසුරු හල්කේවෙල

# හදවතක සෙරීනාඩ්

කතෘ

ඉසුරු හල්කේවල

කතෘගේ වෙනත් කෘති

අවසන් හමුවීම

මා/ සාන්ත තෝමස් ජාතික පාසල

මාතලේ

13 ශ්‍රේණිය

2025.02.08

ISBN 978-624-208-541-8

# පිදුම

**අසීමාන්තික ආදරයක්...**

**හැර දැමිය නොහැකි බන්ධනයක්...**

**දුරස්ව සිටියද, හදවතට හාදුවක් දෙන**

**නොසන්සුන් සිතේ නවතින අවිස්මරණීය බැඳීමක්.**

**ආදරය සීමා නොදන්නා ජීවිතයක සන්සුන් සෙරිනාඩය.**

**නොහැකියාවන් අතර රැඳී සිටියද, හදවතකින් බැඳෙන ආදරය**

**අසීමිත සිහිනවල සැබෑ බවක් ඇතිකරයි.**

**මෙම කතාව ආදරය පතා  නොනැසී ඉන්නා වූ අය සඳහායි.**

**දුරස්ව සිටියද සමීපව සිටින්නෝ සඳහායි.**

**කෙදිනක හෝ එකතුවිය හැකියි යැයි විශ්වාස කරන**

**සන්සුන් ආදරයන් සඳහායි.**

**මෙම ගමනේ,**

**මා එක් පියවරක් වුවද ඉදිරියට ගමන් කිරීමට**

**බලය ලබාදුන් මවට, පියට සහ පවුලේ සැමට,**

**කතාවේ සන්සුන් පද රචනයෙන් හැඩ ගැන්වූ**

**රිසිනි නංගීට,**

**පිටකවරයෙන් සිතින් නිවන් සපයූ ඉඳුරන්ග මල්ලීට,**

**සෙරෙන තරු මවිතයෙන්**

**මේ මොහොතේ තුති පුදමි.**

**නන් අයුරින් උදවු කළ සැමට,**

**මාගේ හෘදයාංගම ප්‍රණාමය!**

ජීවිතේ අපිට හමුවෙන හැම කෙනාම හැමදාම අපේ ලගින් ඉන්නේ නැහැ. ඉතින් සමහරු හැමදාම අපි ලගින් ඉන්නවා වගේම සමහරු අපිව දාලා යනවා. ඒ වගේම තවත් සමහරු දෙහිතක් අතර තනි වෙලා අපිත් එක්ක ඉන්නවා.. ..

ඉතින් මේ ඒ වගේ ලස්සන කතාවක්...

# හදවතක සෙරිනාඩ්

අනුත්තර කියන්නේ ඉස්කෝලේ යන අවුරුදු 17 විතර ළමයෙක්. ඉතින් එයා සාමාන්‍ය පෙළින් පස්සේ උසස් පෙළ කරන්න ඉස්කෝලෙට ආවා විතරයි.. උසස් පෙළට ඉස්කෝලෙට ඇවිත් මාස කිහිපයක් සාමාන්‍ය විදිහට ගෙවුනා. මෙයා ඉස්කෝලේ ගියේ නගරයේ ප්‍රසිද්ධ බාලක පාසලකට . ඒ ආසන්නයේම ඔවුන්ගේ බාලිකා පාසලකුත් තිබුනා. ඉතින් හැමදාම වගේ අනුත්තර ඉස්කෝලේ ඇරිලා යන්නෙ එයාලගේ බස් එක ඇවිත් නවත්තන තැනට එතෙන්ට ගොඩක් ළමයි ඇවිත් ඉන්නවා ගෙවල් වලට යන්න බස් එක එනකල්. ඉතින් බාලික පාසලේ ලමයි ඔතෙන්ට වෙලා ඉද්දි බාලිකා පාසලේ ළමයි ටිකත් ඔතනින් පහු කරන් යනවා. ඔහොම දින සති ගෙවෙද්දි එක දවසක් අනුත්තර අහම්බෙන් ගැහැනු ලමයෙක්ව දැක්කා ඇත්තටම එයා හරි ලස්සන ගැහැනු ළමයෙක් ඉන ලගට විතර දිග කොණ්ඩයක් වගේම දිගැටි ඇස් දෙකක් තිබ්බ එයා සුදු ගවුමට පුංචි සුරංගනාවියක් වගේ ඇත්තටම අහම්බෙන් දැක්ක ඒ කෙල්ල අනුත්තරගේ හිත හොරකම් කරා. ඒ ලස්සන ගෑණු ළමයා එක්ක එයාගේ තව යාලුවෝ දෙන්නෙක් හිටියා. දුර ඉදලම ආපු එයා ආවේ හිනාවීගෙනමයි. ඉතින් අනුත්තර ඒ ගැහැණු ළමයා දිහා බලන් හිටියත් ඒ ගැහැණු ළමයට ඒ බවක් ඇගෙව්වේ නැහැ. ඉතින් අනුත්තර බලන් හිටියා මෙයාලා යන්නේ කොහෙටද කියලා. අනුත්තර ටික දුරක් ගිහින් ආයේ හැරිලා ආවේ එයාගේ තනියටවත් කවුරුත් නැති නිසා. ඒ කෙල්ලො තුන් දෙනා නොපෙනී යනකන් බලන් ඉදලා අනුත්තර ආපහු හැරිලා එන්න ආවා.

.

එදා ගෙදර ගිහිනුත් අනුත්තරට මතක් උනේ මේ පුංචි ගැහැනු ළමයා ගැන විතරමයි . අනුත්තර සැහෙන වෙලා කල්පනා කරේ මෙයාගේ නම මොකක්ද? කීයේද ඉන්නේ? කොහෙද ඉන්නේ මේවා දැන ගන්නේ කොහොමද කියන එක. ඉතින් අනුත්තර හිතාගත්තා හෙටත් ඉස්කෝලේ

ඉවර වෙලා එතෙන්ට ගිහින් බලන් ඉන්නවා කියලා. වෙනදටත් වඩා උනන්දුවෙන් උදෙන්ම ඉස්කොලේට ගිය අනුත්තර එයාගේ යාලුවා වෙච්ච නිසල්ටත් මේ කතාව කිව්වා.

'මචන් නිසල් මට උබට දෙයක් කියන්න තියනවා බන්'...

'ඒ පාර මොකක්ද් මනුස්සයෝ.....'

'හරි හරි වරෙන්කෝ බෙන්ච් එක ළගට යමන් මෙතන ඕවා කියන්න බැ... පොඩ්ඩක් තනියම උබට විතරක් කියන්න ඕනි දෙයක් මේක..'

'හරි හරි එහෙනම් යමන්කෝ.. හැබැයි උබේ ඔය මහ ලොකු කතාව ඇහුවට පස්සේ කැන්ටිමෙන් මොනවා හරි අරන් දීපන් ඈ..''

'හා හා අප්පා යමන්කෝ දැන්..'

පිට්ටනියේ හැම තැනම ළමයි සෙල්ලම් කරති. නිසල්ට හා අනුත්තරට සෙල්ලම් කරන්න යාලුවෝ කතා කරත් අනුත්තර අද බැ බන් කියලා ආවේ මේ ගැන නිසල්ට කියන්නම ඕනි නිසයි..

'මේකයි බන් කතාව මන් ඊයේ බස් එකට නගින්න ඉද්දි මාර ලස්සන කෙල්ලෙක් දැක්කනේ..'

'ආ.. ඒකද මේ උදේ ඉදන් මනෝ පාර ගහන්නේ...'' කියා නිසල් සිනාසුනි.

‘උබට ජෝක්ද බන්.. අහම්බෙන් මන් දැක්කේ ඊයේ..’

‘ඉතින් ඉතින් උබ පස්සෙන් ගිහින් බැලුවේ නැද්ද කවුද කින්ද මන්ද කියලා…’

‘නෑ නේ බන්.. මන් ටික දුරක් ගියා පස්සෙන් ආයේ මන් හැරිලා ආවා.. මන් හිතන්නේ කෙල්ල මට වඩා බාලයි නංගි කෙනෙක්’

‘ඕකත් කවුරු හරි නෙලාගත්ත මලක්ද දන්නේ නෑ ඈහ්…’’ නිසල් සිනාසුනි.

‘අන්න එකයි බන් කේස් එක.. කොහොමද දැන් අපි හොයලා බලන්නේ කවුද කින්ද මන්ද කියලා..’

‘හරි අදත් යමන් එහෙනම් මාත් එන්නම්…’ නිසල් කීවේය..

‘‘අඩෝ ආදරෙයි ඈහ්.. එහෙනම් ලතවෙන්නෙ නැතුව යමන් ඈ අද’’… මා කීවෙමි..

‘‘දැන් හරිනේ යමන් දැන් ක්‍රිකට් පාරක්වත් ගහන්න’’.. නිසල් කීවේය

‘‘හා හා දැන් යමන්…’’ මා කීවෙමි.

වෙනදට තව ටිකක් වෙලා තිබ්බ නම් කියලා හිතෙන මට අද බෙල් එක වදින්නෙ නැද්ද.. කරන්ට් ගිහින්ද දන්නේ නෑ වගේ විකාර හිතෙනවා.. වෙලාව යන්නෙත් හිමින් වගේ.. කොහොම හරි අන්තිමට 1.30 බෙල් එක වැදුනි. මූණ ටිකක් හෝදගත්තු මන් නිසල්වත් ඇදගෙන ගියේ පුදුම හදිස්සියකනි.

“ මොකද බල්ලො කඩි කුලප්පුවද උබට...”

“නෑ නෑ බන් අර කෙල්ල යයි ඉකමනට යමන්...”

“උබ නම් පුදුම වදයක් බන් යමන්කෝ...”

ඉක්මනින් එලියට පැන ගත්තු අපි දෙන්නා බස් නැවතුම්පොලට ආවේ වෙන

කාටත් කලිනි..

“ගිහින්ද බන්..” නිසල් ඇසුවේය.

“නෑ නෑ බන් යන්න විදියක් නෑ අපි තමා කලින්ම ආවේ අද..” මා කීවෙමි

“එහෙනම් ඉමුකෝ ටිකක් බලාගෙන තාම එනවා ඇති..”

“හ්ම් හ්ම්..”

ටිකෙන් ටික බස් නැවතුම්පොල සුදු ඇදුමින් සැරසුනු ළමයින්ගෙන් පිරී යන්නට විය..

"මචන් දැන් නම් ළමයි ඔක්කොම වගේ ආවා හොදට බලපන් උබේ නංගී බබා එනවද කියලා..." නිසල් කීවේය

" ඉදපන්කෝ මාත් මේ බලන් තමා ඉන්නේ.." ඉවසුම් නැති මා කීවෙමි.

"ඒයි ඒයි නිසල් ආන් අර එන්නෙ බන්.." මා කීවෙමි

කෝ කෝකද බන්.. කීදෙනෙක් එනවද?

අර උබට පේනවද කහ ඉර පැනලා එහා පැත්තෙන් කෙල්ලො තුන් දෙනෙක් එනවා..."

ආ ඔව් ඔව් පේනවා... එතනින් කෝකද?

"වම් කොනේ එන කෙල්ල බන්" මා කීවෙමි

"අම්මට සිරි අර හදක් වගේ කෙල්ලද...? ලස්සනයි ඈ.. හැබයි ඕක නම් කාගේ හරි වෙන්නති බන්.."

“අප්පො බන්.. පටන් ගන්නත් කලින් මූසල කතා කියන්න එපා..” මා කීවෙමි

“නෑ නෑ බලපන්කෝ ලස්සන.. එකයි මන් කිව්වෙ.. කමක් නෑ අපි බලමු” නිසල් කිව්වේය.

මේ අපිත් පාර පනිමුද බන්? මන් ඇසුවෙමි..

ට්‍රැක්ද යකෝ උබට.. අපි ලයින් එකේ එකීට දැනෙන් නැති වෙන්න යමන් පස්සෙන්...” නිසල් කිව්වේය

“හරි එහෙනම් යමන්කෝ..” මා කීවෙමි.

“ආන් ආන් කෙල්ලො තුන්දෙනා ජූස් බාර් එකට ගියා...” නිසල් කීවේය.

“ඔව් නේ බන්.. ඊයේ නම් කෙල්ලො තුන්දෙනාම මේ පැත්තෙන් ඉස්සරහට ගියේ..” මා කීවෙමි

“උබට ශුවර්ද ඊයේ උන් ගියේ ගෙදර යන්න බස් එකටමයි කියලා.. ” නිසල් ඇසුවේය

“මන් ගෙදර යන්නම ගියාද කියන එක කොහොමද බන් හරියටම දන්නේ.. උන් ගියේ මේ පැත්තෙන් කියන එක ශුවර් එච්චරයි..”

“ඒකනේ බන්..”

මේ උබට පරක්කු වෙන්නේ නෑ නේ... කෙල්ලො තුන්දෙනා එනකම් අපි මෙතෙන්ටම වෙලා ඉමුද? මා ඇසුවෙමි.

"අයියෝ දෙයියනේ! මේවට තමා බන් කියන්නේ උරුම කරුම කියලා... ඕන්න ඔහේ ඉමු.." නිසල් කීවේ සිනාසෙමිනි.

විනාඩි 15 ක් පමණ බලා සිටි අප දෙදෙනා දැක්කේ නැවත් ඔවුන් ආපසු අප දෙසට පැමිනෙණ බවයි

"ආන් යකෝ මේ පැත්තට එනවා..." නිසල් කිවේ මගේ කනට ලං වෙමිනි.

ඒකනේ බන්.. උන්ට මීටර් උනාවත් ද?

"නෑ නෑ එහෙම වෙන්න විදිහක් නෑ.. අපි දෙන්නා මෙතනම ඉදලා කයියක් ගහනවා වගේ පේන්න ඉමු".

අපි දෙන්නා කතාවක ඉන්නා ලෙස හැසිරුනෙමු. ඔවුන් තිදෙනා අප දෙදෙනාද පසු කරමින් නැවත ඔවුන්ගේ පාසල දෙසට ගමන් කළහ.

"මචන් ශුවර් එකටම උන්ට අද ක්ලාස්.."

"උබ කොහොමද එහෙම කියන්නේ? මා ඇසුවෙමි

“ඇයි යකෝ දැක්කේ නැද්ද අර කෙල්ලගේ අතේ කැම එකක්ද කොහෙද තියනවා. මන් හිතන්නේ බන් උන්ට අද ක්ලාස්” නිසල් කීවේය.

ඔහු කියන කතාවේත් ඇත්තක් ඇත. නැති නම් පෙර දින බස් නැවතුම්පොල දෙසට ගිය ඔවුන් අද ආපසු පැමිනෙන්නේ නැත.

“මේ අපි පස්සේන් ගිහින් බලමුද බන්” මා ඇසුවෙමි.

“මොලේ හොද නැද්ද බන් උබට..? නිසල් ඇසුවේ තරහිනි.

“ඇයි මොකද වෙන්නෙ? මා ඇසුවෙමි.

“ඇයි යකෝ අපි මෙතනත් ඉදලා ආයේ පස්සෙනුත් ගියොත් මීටර් වෙනවා වැඩේ. අපි දැන් ශේප් එකේ කැපෙමු” නිසල් කීවේය.

ඒකත් ඇත්ත.. දැන් ආයේ පසුපස ගියොත් ඔවුන්ට එය දැනෙනු ඇත.

“මේ එහෙනම් දැන් අපි ගෙදර යමන්... හෙට ඉස්කෝලේ වරෙන්කෝ.. හෙටත් බලමු” නිසල් කීවේය.

“හරි එහෙනම් උබ පරිස්සමින් පලයන් මාත් මෙහෙන් යන්නම්..” මා කිවෙමි.

එසේ කියා මා ඔහුට සමුදී ඉද ගන්නට ඉඩක් ඇති බස් රථයකට නැගුනේ අදත් කිසිම දෙයක් දැන ගැනීමට නොහැකි වූ පසු තැවිල්ලක් සමගය..

පැය බාගයකයට පමණ පසුව ගෙදර පැමිනි මා දහවල් ආහාරයද ගෙන කාමරය වෙත ගියේ සිතේ වූ දැඩි කුතුහලයද සමගය. ඇදට වැටුනු මා නොදැනුවත්වම නින්ද ගොස් ඇහැරෙද්දි වේලාව හවස 5.30 පමණ විය. තේ බීමෙන් පසුව මා පොතක් අතට ගත්තේ පාඩම් කිරීමේ බලාපොරොත්තුවෙනි. එහෙත් එක සිතකින් පාඩම් කිරීමට මට නොහැකි විය. නිතර නිතරම ඇයව මතකයට නැගෙන්නට විය.

එදින රැයත් ඔහුට පෙරදින රාත්‍රිය සේම විය. හෙට පාසල් යනතෙක් ඔහුට ඉවසිල්ලක් නැති විය. රාත්‍රී ආහාරයෙන් පසු ඇදට වැටුන ඔහුට නින්ද නොගියේ ලොකු කල්පනාවක නිමග්නව සිටි බැවිනි.

හෙටවත් හම්බෙයිද? එයාගේ නම මොකක්ද? කොහොමද ඒක මන් දැනගන්නේ? හෙටත් ක්ලාස්ද දන්නේ නෑ? එහෙම උනොත් ඉවරයි. මේ වගේ සිතුවිලි දහසක් ඔලුවට ගලාගෙන ආ අනුත්තරට නොදැනීම නින්ද ගියේය.

පසු දිනත් උදේම අවදි වූ ඔහු නිසල්ට ඇමතුමක් ලබා ගත්තේ එදින පාසල් පැමිනෙනවාදයි දැනගැනීමටය.

“හෙලෝ.. ගුඩ් මෝනින් උබ අද එනවා නේ? මා ඇසුවෙමි.

“අයියෝ උදේ පාන්දරම වාතයක් බන් උබ..” නිසල් කීවේ ඔහුව උදැසනම අවදි කිරීමේ තරහද ඇතිවය.

“එනවද කියපන්කෝ බයිලා නැතුව..” මා කීවෙමි

“ඔව් ඔව් එනවා බන්.. මන් උබට ඊයෙත් කිව්වේ එනවා කියලා”…

“ආහ්.. එහෙනම් එච්චරයි.”

“උබටත් මන් එනවද අහන්න මතක් වෙන්නේ ඔය වගේ වැඩක් තිබ්බොත් තමා ඉතින්” නිසල් කීවේය.

“හරි හරි ඉතින්.. උබ වරෙන්කෝ අද කන්න මොනවා හරි අරන් දෙන්නම් දවල්ට” මා කීවෙමි.

“ආන් එහෙම වරෙන්..” කියමින් නිසල් ඇමතුම විසන්ධි කලේය.

එහෙනම් ඒකත් හරී ඌත් එනවා අද කොහොම හරි හොයාගන්න එක තමා තියෙන්නේ. මා සිතින් කල්පනා කළෙමි.

උදේ 7ට පමන පාසල වෙත ගිය මා නිසල් එනතෙක් පිට්ටනියට වී සිටියෙමි. 7.10 පමන ඇතින් පිට්ටනිය දෙසට ඔහු එනවා මා දැක්කෙමි.

“ආ ප්‍රේම කුරුල්ලා… මොකෝ ඉතින් උදේම කල්පනාව..” කියමින් නිසල් මා ලගින් වාඩි උනේය.

“මුකුත් නෑ බන්. මන් මේ කල්පනා කරේ කොහොමද අපි මේක හොයා ගන්නේ කියලා…”

“හරි හරි අපි බලමුකෝ අද මොකද වෙන්නේ කියලා...” නිසල් කීවේය.

දවල් වරුවද ඉතා සෙමෙන් ගෙවී යන්නාක් මෙන් මට හැගිනි. මා හැමවෙලේම සිතුවේ එය ගැනයි. වෙනදා නිතරම සෙල්ලම් කිරීමට උවමනා වූ මට මේ දිනවල ඕනි වූයේ තනිවී කල්පනා කිරීමයි.

කෙසේ හෝ 1.30 පාසලේ අවසාන සීනුව වැදුනි. ඒ සීනු සද්දෙත් සමගම මගේ සිතද ප්‍රීතිමත් වුනි. මා නිසල් සමහ ඉක්මනටම අපේ බස් නැවතුම්පොල වෙත ගියෙමි.

“මේ අද නැද්ද දන්නේ නෑ නේ..” නිසල් ඇසුවේය.

“අප්පෝ මූසල කතා කියන්න එපා බන්.. මා කීවෙමි.

හරි හරි මන් නිකන් කිව්වේ ඉතින්..

කෙසේ හෝ අප දෙදෙනා විනාඩි 10ක් 15ක් අතර එතන බලා සිටියෙමු.

“මෙ මේ ආන් එනවා උබේ කිරිකැටේ” නිසල් කීවේය සිනාසෙමිනි.

“අඩෝ ඔව් බන්.. තුන්දෙනාම එනවා ශේප් එකේ අදත් යමු...” මා කීවේ ඉමහත සතුටිනි.

ඔවුන් අප පසු කරන් ගිය පසු අපද ඔවුන් පසුපස ගමන් කිරීම ආරම්භ කළෙමු. ඔවුන් ටික දුරක් ගිය පසු අප දැක්ක දෙයින් අප දෙදෙනාම මුහුනෙන් මුහුණ බලා ගත්තෙමු.

අපේ පාසලට ටිකක් දුරින් ඔවුන් තුන්දෙනා අපේ පාසලේම අපිට බාල පන්තියක මල්ලී කෙනෙක් සමග කතා කර කර ඔවුන් ඉදිරියට ඇදෙන්නට විය.

“ඒ මොකක්ද බන් ඒ උනේ…” නිසල් ඇසුවේය.

“සිරාවටම මොකක්ද බන් ඒ උනේ.. මූ කලින් දවස් දෙකේම හිටියේ නැ නේ…” මා කීවෙමි.

“මන් නම් හිතන්නේ උබ ඔය පස්සෙන් ගිහින් කරන්නේ වැඩක් නැති වැඩක් කියලා…” නිසල් කීවේය.

“හරි හරි බන් අපිට හරියටම කියන්න බැ නේ ඌ ඒ කෙල්ලගේ කොල්ලා කියලා..” මා කිවේ ටිකක් තරහෙන් මෙන්ම දුකෙනි.

“හරි හරි බන් එහෙම උනත් ඔහොම කතා කර කර යන්නේ නැ නේ බන්…”

“උඹ කොහොමද හරියටම කියන්නේ ඒ ඒකිගෙම කොල්ලා කියලා.. එතන තව කෙල්ලෝ දෙන්නෙක් ඉන්නවා නේ…” මා කීවෙමි.

“උඹ කියන කතාවත් ඇත්ත හැබැයි ඒ ඒ කෙල්ලගෙම කොල්ලා කියලා කියන්නත් බෑ..”

“ඒකනේ..” මා කීවෙමි.

“දැන් හැබැයි අපිට පොඩි පොටක් පෑදිලා තියෙන්නේ මේක හරියටම දැනගන්න...” නිසල් කීවේ උද්‍යෝගී හඬකිනි.

“ඒ මොකක්ද බන් ඒ..”මා ඇසුවෙමි.

“දැන් බන් අර පොඩි එකා ඉන්නේ ඌව මතකයි නේ උබට..”

“ඔව් ඉතින්..”

“ඉතින් බන් හෙට අපි ඉස්කෝලෙදි ඌව අල්ලගමු.. ඊට පස්සේ ඔක්කොම හොයාගමු..”

“අම්මටසිරි ඔව් නේ... හෙට පොඩි එකාව හොයා ගත්තා නම් ඔක්කොම හරි..” මටද එය මතක් වූයේ එවිටය.

“හරි එහෙනම් හෙට පොඩි එකාව හොයාගමු.. ඊට පස්සේ විස්තර දැන ගමු..”

“හරි එහෙනම් එහෙම කරමුකෝ” මා කීවේ අද දවසේද කිසිදු දෙයක් දැනගැනීමට නොහැකි වීමේ අසතුටද සහිතවය.

“එහෙනම් හෙට සෙට් වෙමු ඈ...” නිසල් කීවේ මගේ පිටට තට්ටුවක් දමමිනි.

ඒ දවස ද පෙර දින සේම ගතවිය. පසුදා උදැසනින්ම පාසල් ගිය මන් උදැසන සිට සෙව්වේ අර පොඩි එකාවයි. ටික වෙලාවකින් මට එකතු වූ නිසල්ද ඔහුව සෙවීමේ කාර්යට සහභාගී වුනේය. උදේ පාසල ආරම්භ කිරීමට පෙර අප ඔහුව සෙවුවද අපට ඔහුව දැකගත හැකි වූයේ නැත.

“මේ බන් දැන් හොයලා වැඩක් නෑ.. අපි ඉන්ටවල් එකේ හොයමු” නිසල් කීවේය.

“හරි එහෙනම් අපි දැන් පන්තියට යමන්..”

පන්තියට ගිය අප දෙදෙනා බලා සිටියේ විවේක කාලයට බෙල් එක වදිනකන්ය. රසායන විද්‍යාව කාලච්ඡේදය ඉවර වනවාත් සමගම 10.30 වේලාව වන විට සීනුව නාද විය.

“අපි ඉක්මනට කාලා යමන් පිට්ටනියට.. ඌ අත හෝදන්නවත් එයි නේ ඒ පැත්තේ..” මා කීවෙමි.

“ හරි එහෙනම් කාලා යමන්..” නිසල් කීවේය.

ඉක්මනින් බත් කා ඉවර උනු අප දෙදෙනා ගියේ පොඩි එකාව හොයාගන්නයි. ටික වේලාවක් පමණ පිට්ටනිය වටා ඇවිද්ද අපට 10 පන්ති දෙසින් ඔහුව දැකගන්න ලැබිණි.

“ආන් බන් අරූ ඉන්නවා..” මා කීවෙමි.

“අම්මට සිරි ඔව්මයි.. යමන් අල්ලගමු..” නිසල් කීවේය.

“මෙ මේ පොඩි එකාට මුකුත් කරන්න එහෙම යන්න එපා ඇහ්.. අය දන්නවා නේ තවත් නඩුවක්..” මා පැවසුවේ නිසල්ගේ හැටි හොඳින් දන්නා නිසාය.

“ස් ස් ඒ මල්ලී...” නිසල් කතා කරේය.

දුර සිට ඔහු මටද කියා ඇසුවේ අතක් තමා දෙසට දික් කරමින් පෙන්වමිනි.

“ඔව් ඔව් උබට තමා මෙහේ වරෙන්..” නිසල් කෑ ගැසුවේය.

අප සිටිනා දෙසට ඔහු දුවගෙන ආවේ හිතේ යම්කිසි චකිතයක්ද ඇතිවය.

“ඇයි අයියා..” ඔහු ඇසුවේය.

“අපි උබට කතා කරේ පොඩි තොරතුරු වගයක් දැන ගන්න..” මා කීවෙමි.

“ඉස්සෙල්ලා මේන් මෙතනින් ඉද ගනින්කෝ..” නිසල් කීවේය.

“අපි දැන් උඹෙන් අහන දේවල් වලට උඹ ඇත්තම කියන්න ඕනි ඈ..” මා කීවෙමි.

“හරි අයියා..”

“උඹ ඊයේ හවස අර කෙල්ලෝ තුන්දෙනෙක් එක්ක කතා කර කර හිටියා නේ” මා ඇසුවෙමි.

“ඔව් අයියා.. ඔහු කීවේ තරමක් බියෙනි.

“කවුද ඒ ..” නිසල් ඇසුවේය.

“මගේ යාලුවෝ අයියා..”

“මල්ලී මේ නිකන් බොරුව දාන්න එපා අහ්..” උබලට අපිව හාවෝ වගේද පේන්නේ..” නිසල් කීවේ තරමක් උස් හඬිනි.

“මල්ලී මේ අහපන් අපි උබට මුකුත් කරන්නේ නෑ.. හැබැයි උඹ අපිට ඇත්තම කියන්න ඕනි..” මා කීවෙමි.

“හා අයියා..”

“හා හා නෙවෙයි.. දැන් කියපන්..” නිසල් කීවේය.

“කවුද එතනින් උබේ කෙල්ල.. මා ඇසුවේ හිතේ චකිතයක්ද සහිතවය..”

“අර සුදු කෙල්ලත් එක්ක ඉන්න ටිකක් කොට කෙල්ල අයියා..” ඔහු කීවේය.

“අර සුදු බෝලේ වගේ කෙල්ල උබේ කෙල්ල නෙවෙයි නේ? මා ඇසුවෙමි..”

“නෑ අයියා .. ඒ මගේ කෙල්ලගේ හොදම යාලුවා..” ඔහු කීවේය.

ඔහු එය කීමෙන් පසුව මගේ හිතේ සියුම් සතුටක් ඇති විය.

“හරි ඒ කෙල්ලගේ නම මොකක්ද? මා ඇසුවෙමි.

“තිනාරා අයියේ එයාගේ නම..”

“ආහ්. එහෙමද කොහෙද ඉන්නේ එයා..” නිසල් ඇසුවේය.

“එයා මේ ලගම තමා අයියා..”

**“එහෙමද ? ඒ කියන්නේ 10 නේ දැන්..”**

**“ඔව් අයියා..” ඔහු කීවේය**

**“හරි හරි දැන් උඹ පලයන්..” මා කීවෙමි.**

**ආපසු පන්තිය දෙසට පියනගන්නට වූ ඔහුට හරස් වූයේ මාගේ මිත්‍රයායි.**

**“ඒයි ඒයි..” ඔහු කෑ ගැසුවේය.**

**“ඇයි අයියා…” ඔහු ඇසුවේ ඒ පාර මොකද මෙනි.**

**“උඹේ නම මොකක්ද කියලා පලයන්..” නිසල් කීවේය.**

**“ආහ්.. මගේ නම ශෙහාන් අයියා..” ඔහු කීවේය.**

**“ආ හරි හරි… දැන් පලයන්..” මා කීවෙමි.**

**“අඩෝ දැන් වැඩෙක් භාගයක් ඉවරයි.. ඉතුරු ටිකත් කරගන්න තමා තියෙන්නේ දැන්..” නිසල් කීවේය.**

**“අඩෝ ඔව් නේ.. මෙච්චර දවස් දැනගන්න හදපු දේවල් දැන ගත්තා නේ..” මා කීවෙමි.**

**ඒකනේ දැන් හෙමීට කරන් යන් වැඩේ.. නිසල් කීවේය.**

**එදින හවසත් අපි වෙනදා මෙන් බලා සිටියෙමු.. ටික වෙලාවකට පසුව ඇයත් ඇයගේ යහලුවන් තිදෙනාත් සමග අප පසු කර ගියාය. අප දෙදෙනාත් වෙනදා මෙන්ම ඔවුන්ගේ පසුපස ගියෙමු.**

**“ඒ බන් හැමදාම මේක හරියන් නෑ.. නිසල් කීවේය.**

**“ඇයි මොකක්ද අවුල..” මා ඇසුවෙමි.**

**“අද යමන් ළඟටම..” නිසල් කීවේය.**

**“ඔව් නේ බන් හැමදාම එකමනේ අපි කරන්නේ... එහෙනම් යමන්...”මා කීවෙමි.**

**සෙමින් සෙමින් ඔවුන් නැවතී සිටින තැනට ලං වූ අප දෙදෙනා ඔවුන් පෙනෙන මානයේ නැවතී සිටියෙමු. මා හොරෙන් ඇය දෙස බලා සිටියෙමි. එහෙත් එක් නිමේශයකින් ඇයගේ නෙත් මා දෙසට හැරුනි. මා ඇය දෙස බලා සිටිනා බවක් ඇය දුටුවාය. ඒත් සමගම මම අහක බලා ගත්තෙමි.**

**“මේ ඕයි.. මාර වැඩක් නේ උනේ..” මා කීවෙමි**

“ඇයි ඇයි බන් මොකද උනේ…” නිසල් ඇසුවේය.

“මන් අර කෙල්ල දිහා බලන් ඉද්දී ඒකී දැක්කනේ..” මා කීවෙමි.

“ආහ් හරිනේ දැන්…” නිසල් කීවේය.

“ශිශ් ඒකී එක පාර මේ පැත්ත බලද්දී දැක්කනේ බන්..” මා කීවෙමි.

“ඒත් අවුලක් නෑ බන්… ඒකී දැක්ක එකත් හොදයි..” නිසල් කීවේය..

“ඇයි ඒකේ හොද මොකක්ද දැන්..” මා ඇසුවෙමි.

“එතකොට බන් ඒකීට දැන් නෝට් වෙයි නේ උබ පස්සෙන් එනවා කියලා..” එතකොට පොඩ්ඩක් ලයින් වෙයි..

“හ්ම් හ්ම් බලමුකෝ..” මා කීවෙමි.

සෙනසුරාදා දවස පන්ති සදහාම ගත වූ අතර ඉරිදා දිනත් දහවල් කාලයෙ මට පන්තියක් තිබිනි. එයත් අවසන් වූයේ සවස 5 ට පමනය. යහලුවන් සමග කතාවට වැටී බසය තෙක් යන විට බස් රථය අප පසු කර යනවා දක්නට ලැබිනි. මාත් යහලුවන් සමග බස් රථය වෙත දුව ගොස් නැග ගන්නා විට අහම්බෙන් දැක්කේ බසයක් එන තෙක් ඉන්නා තිනාරා හා

ඇයගේ යෙහෙළියයි. මට නැවත බසයෙන් බැසීමටද නොහැකි නිසා එදින මන් බස් රථයේ ගියෙමි.

පසු දින සඳුදා දිනයෙද පෙර දිනවලදී සේම මාත් නිසලුත් ගියේ අපට පුරුදු තැනටමය. ඇය එනකන් සිට ඇයගේ පසුපසින් ගොස් ඔවුන් සිටි තැන නැවතී සිටියෙමි. එදින ඇය මට සිනාසුනාය. මාත් ඇයට සිනාසුනෙමි. මෙසේ මාසයක් පමන අප අපිට සිනාසෙමින් ඉරියව් වලින් පමනක් කතා කළෙමු.

කාළයත් සමගම මා 13 වසරටද ආවෙමි. වැඩ කටයුතුද ඉතා අධික විය. පන්තිද වැඩි විය. පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උලෙළ නිසා එහි වැඩ කටයුතු නිසාද මා ඉතා කාර්‍යබහුල වී සිටියෙමි. මේ දිනවල මා පාසල් ඉවර වී පාසලෙන් යන්නේ වෙනදාට වඩා සවස් කාලයේ නිසා ඇයව දැක ගැනීමට මට නොහැකි විය. එක් දිනක් ඇයව බලාගැනීම සඳහාම මා කළින්ම පාසලෙන් පිටත් වුනෙමි. ටික වෙලාවක් බස් නැවතුම්පොලෙහි රැදී සිටි මා හට දැකගැනීමට ලැබුනේ කකුලක් වෙලාගෙන මා පසු කර යන ඇය හා යහලුවෝ තිදෙනායි. මා හට එය දැක සිනහා ගියත් මා එය මැඩගෙන ඇයට මොකද උනේ අසා අතවැනුවෙමි. ඇය කිසිත් නොපවසා අත වනා පමණක් ගියාය.

පාසලේ ක්‍රීඩා උත්සවයද අවසන් වූ අතර මට සතියේ දිනවල දී ද පන්ති පැවැත්විනි. මේ නිසාම මගේ පාසල් ගමනද නැවතුනි. ඇයව මට මතක් තිබුනත් මගේ ළග ඇයගේ නම්බර් එකක්වත් නොතිබිනි. කෙසේ හෝ ඇය මට නැවත හමුවුනේම නැති තරම්ය. මේ අතරේදි මා කුඩා කාලයේ සිට ආශ්‍රය කල විහාරා නංගී මට ලන් උනි. ඇය මට පන්ති අවසන් වී සති පතා මුනගැසුනි. දිනපතා අප දෙදෙනා මැසේජ් කලෙමු.

මේ අතරතුරම තිනාරා අලුතින් ඉන්ස්ටග්‍රෑම් ගිණුමක් හදාගෙන මාව ෆලෝව් කලාය. එයින් ඇයව  මට සම්බන්ධ කර ගැනීමට හැකි විය. අප දෙදෙනා එකිනෙකාව හඳුනා ගත්ත අතර දිගින් දිගටම මැසෙජ් කලෙමු.

ඇයගේ කතාව වෙනස්ම කතාවක් විය. ඇය වැඩිය පිරිමින්ට කැමැත්තක් නොදැක්වුවාය. මන්ද ඇයගේ කලින් පෙම්වතා ඇයව අත් හැර ගොස් තිබිනි. මේ නිසා නිතරම ඇය පැවසුයේ කොල්ලෝ නම් එපා අයියා.. වගේ දේවල් ය. ඇය මෙසේ තත්වෙක සිටින විට මං මගේ ආදරය ප්‍රකාශ කිරීම වරදක් සේ මට හැගුනු නිසා මා එය යටපත් කර ගත්තෙමි. ඇය සමග මැසෙජ් කිරීම පවා සීමා කලෙමි.

මේ අතරම විහාරාත් මා ගැන උනන්දුවක් දක්වන බව මට හැගුනි..  ඇය නිතර මා ගැන සොයා බැලුවාය. දිනපතා මැසේජ් කලාය මට තේරුම් ගියේ නිකරුනේ ඇය පසුපස ගොස් වැඩක් නැති බවයි. පසුව යාලුකමද නැති වී යැයි මට හැගුනි..

ටික කාලයකට පසුව විහාරාත් මගෙත් යාලුකම ආදරයක් වූයේ නොදැනිමය. දිනක් අප දෙදෙනා පන්ති අවසන් වී ගෙදර යාමට බස් නැවතුම්පොලට ගියෙමු එදින් වැසි සහිත දිනක් විය. මා ඇයගේ කුඩයේ ගියෙමි. ඈතින් මා දුටුවේ රතු පාට ගවුමක් ඇදගත් තිනාරා හා ඇයගේ යහලුවායි. මා ඇය දුටුවා සේම ඇයද මා දුටුවාය. නමුත් ඇය මා නොදැක්කා සේ පාර මාරු උනි.

ගෙදරයාම සදහා මාද විහාරා ද බසයට ගොඩ වුනි. ටික වෙලාවකින් බසයට නැග්ගේ තිනාරායි. ඇය මා දුටුවාය. නමුත් මා නොදන්නා සේ ගොසින් වෙන තැනකින් ඉද ගත්තාය. කෙමෙන් කෙමෙන් ඇය බසයෙන් බැසීමට මා සිටි තැනට ආවාය. මා එවිට ඇයට කතා කිරීමට බලාපොරොත්තුවෙන් ඇයගේ මුහුණ දෙස බැලුවත් මගේ මුහුණ දෙස

බලා සිටිය ඇයගේ මුහුණේ තිබුනේ දුක්මුසු බැල්මකි ඒ ඇයිද කියා මට නොවැටහුනු නිසා මා ඇයට කතා කිරීමෙන් වැලකී සිටියෙමි.

එදින ගෙදර ගොස් දුරකතනය බැලූ මට තිනාරාගෙන් පණිවිඩයක් ඇවිත් තිබෙනවා දක්නට ලැබුනි. "ලස්සන කපල් එක අයියා" ඇය එවා තිබුනේ එපමණකි. මාත් එයට පිලිතුරු ලෙස මැසේජ් එකක් දැම්මත් ඇය එසේ කිව්වේ දුකින් දෝ කියා සිතුනි. ඒත් මොකටද කියා මට සිතා ගැනීමට නොහැකි වූ නිසා මා එය අමතක කලෙමි.

කෙසේ හෝ එදිනත් ඇය මා සමග ටිකක් වෙලා මැසේජ් කලාය. කෙමෙන් කෙමෙන් කාලය ගතවෙද්දී ඇය මා සමග බොහෝ හිතවත් සේම බොහෝ සෙයින් ඇය මට ලං විය.

ඇයගේ ප්‍රශ්න ඇයගේ පාසල් වැඩ කටයුතු වගේ සියලු දේ ඇ මා සමග පැවසුවාය. ඒ නිසාදෝ ඇය මා හට මා ඇයට කැමැත්තෙන් සිටි බව ඇයට කීමට අවශ්‍ය විය. නමුත් විහාරා මා සමග සිටිද්දී ඇයට එය කීමට මගේ සිත ඉඩ නොදුනි. මන් ඇයට විටින් විට ඉගි පමණක් ලබා දුන්නෙමි. එහෙත් ඇයට ඒවා නොතේරුනි.

මා ඇයට කැමැත්තෙන් සිටි බව ඇයගේ වයස අපේ පාසලේ ලමුන් බොහොමයක් හොදින් දැන සිටිහ. දිනක් ඔවුන්ගෙන් එක් අයෙක් මට මුනගැසුනි.

"ආ අයියා කොහොමද ? ඔහු ඇසුවේය.

"ඉන්නවා බන් ඉතින්.. මොනවා වෙන්නද?.. මා කීවෙමි.

“ආන් අයියගේ දෝනි පස්සෙන් කොල්ලෙක් එනවා..” ඔහු කීවේ සිනාසෙමිනි.

“මොන දෝනියෙක්ද බන්.. මා ද පැවසුවේ සිනාසෙමිනි.

“ඇයි තිනාරා..” ඔහු කීවේය.

“ආහ්.. ඉතින්..” මාබ් ඇසුවේ කුතුහලයෙනි.

“ආන් කොල්ලෙක් එනවා.. ආරන්චිය හැටියට නම් එයත් කැමතියි කියලා තමා කියන්නේ.

“අඩෝ එහෙමද බන්.. මා කිවේ හිතේ ඇති වූ දුකක්ද සමගය.

“ඔව් අයියා.. එහෙම තමා ආරන්චිය..” ඔහු කීවේය.

“නමක් එහෙම මුකුත් දන්නේ නැද්ද... මා ඇසුවේ දැඩි කුතුහලයෙකිනි.

“ඒක නම් දන්නේ නෑ අයියා..” ඔහු කීවෙය.

“හරි බන් හරි.. මන් ගිහින් එන්නම්කෝ අහ්..”

“හරි අයියා...”

එසේ මා ඔහුට සමුදී ආවෙමි. එවෙලේ සිට මගේ සිතේ කුතුහලයක් මෙන්ම සිතේ නොසන්සුන් බවක්ද තිබිනි. මන්ද කලක් මා ඇයට ආදරය කළෙමි. ඇයගේ හුරුබුහුටිකම ඇයගේ හැසිරීම වගේ දේවල් වලට මගේ සිත තවමත් ඇය ලග මොහොතකට හෝ නතර වෙයි.

ඇත්තටම ඇයි? මන් විටෙක මගෙන්ම ප්‍රශ්න කරයි. ඒත් ඒ ප්‍රශ්නයට උත්තර මගේ ළග නැත. කෙසේ හෝ මේ ගැන මගේ සිත වද දුනි. එදා සවස මන් ඇයට කෙටි පණිවිඩයක් යවා එය ගැන ඇසුවෙමි. ටික වෙලාවකට පසුව මා ඇයගෙන් එයට පිළිතුරු එවා ඇති බව දුටුවෙමි. මා ඉක්මනින්ම එය බැලුවේ මගේ සිතේ වූ දැඩි කුතුහලය නිසායි.

මගේ ප්‍රශ්නයට ඇය පිලිතුරු ලෙස එවූ පණිවිඩයේ සදහන් වූයේ ඇයගේ එසේ කිසිත් නැති බවත් එය බොරුවක් බවත්ය. ඇයගේ ඒ පිළිතුරෙන් මගේ සිතේ සතුටක් ඇති වූයේ මා ඇයට කාලයක් ආදරය කළ නිසා විය යුතුයි.

කෙසේ වෙතත් ඇය මට හමු වී ගෙවුනු ටික කාලය තුලදී ඇයත් මාත් බොහෝ දේ බෙදා හදා ගත්තා මෙන්ම ඇයගේ සියලු තොරතුරු සියලු දේවල් ඇය මා සමග පැවසුවාය. මේ හේතු නිසා ඇය මට මගේම සහෝදරියක් ලෙස දැනුනි. ඇයට සිටියේ තවත් සහෝදරියන් දෙදෙනෙක් පමණි.

දිනක් ඇය මට පැවසුයේ මටත් අයියා කෙනෙක් සිටියා නම් හොදයි කියායි. එදින ඇය ගැන මට අනුකම්පාවක් ඇති විය. මා ඇයට ආදරේ කරත් එදා සිට ඇයට ලං වූයේ සහෝදරයෙක් සේය.

කෙමෙන් කෙමෙන් මෙලෙස කාලය ගෙවී යන්නට විය. නැවතත් පෙර පරිදිම ඇයගේ සම්බන්ධය පිළිබඳව එක එක්කෙනා මට කියන්නට විය. මේ පාරත් පෙර පරිදිම ඇයගෙන් මා එය විමසුවත් මෙවර ඇයගේ පිළිතුරද ටිකක් වෙනස් වන්නට විය. ඇය එහෙම දෙයක් නැතැයි පැවසුවද පෙර පරිදි ඒ පිලිතුර ස්තීර නොවීය.

මෙවර මගේ සිතෙද දැඩි සැකයක් මතු වූයේ ඇයගේ ඒ පිලිතුරු නිසායි. මේ නිසාම කෙසේ හෝ මා එය සොයා ගන්නවා කියා මා සිතා ගත්තෙමි.

මා සමීපව ඇසුරු කරන ඔවුන්ගේ වයස ලමයි කිහිප දෙන්නෙක්ගෙන්ම ඇසුවත් ඒ වගේ දෙයක් ආරන්චි වූ වගක් කිව්වා මිස ඔහු කවුද ඔහුගේ නම මොකක්ද යැයි කිසිත් ඔවුන් නොකීහ.

ඇයගේ යහලුවන් තිදෙනා අතරින් ඇයට හොදම යහලුවෙක් සිටියාය. ඇයගේ නම රශිනි කියා මා දන්නේද ටික කාලයකට පසුවයි. ඇය ශෙහාන්ගේ පෙම්වතියයි. මා ශෙහාන්ගෙන් මේ ගැන විමසුවද ඔහුගෙන් ඒ ගැන යමක් දැන ගැනීම ඉතා අපහසු බව මට තේරුම් විය. මන්ද තිනාරා හා ශෙහාන්ද හොදම යාලුවෝය.

ශෙහාන්ගෙන් මා කොතෙක් ඇසුවත් ඔහු මට සියල්ල නොකීවේය. ඔහු මට යමක් වසන් කරන බව මට දැනුනි. ඊට පසු ඔහුගෙන් එය විමසීම තේරුමක් නැති වැඩක් බව මට වැටහුනි.

මා පසුව මේ ගැන දැන ගැනීම සදහා ඇයව හොදින්ම දන්නා මා ලගින්ම ආශ්‍රය කරනා අප පාසලේ ඇයගේ වයසම ලමුන් කිහිප දෙනෙක් තොරා ගත්තෙමි. මා ඔවුන්ගෙන් ඇසුවත් ඔවුන් එය පැවසීමට පැකිලුනි. මා නැවතත් ඔවුන්ගෙන් ඒ පිලිබදව තරයේ අසා සිටියෙමි.

එවර ඔවුන්ගෙන් මට සෑහීමකට පත් විය හැකි පරිදි පිළිතුරක් ලැබිණි.

“මෙහෙමයි අයියා.. එකෙකු කතාවට මුල පිරුවේය.

“හරි මොකක්ද කියපන්කෝ කතාව.. මා කිවේ ඔවුන් මෙය මට කීමට පැකිළීම නිසා වූ තරහත් සමහය.

කට්ටිය ඔක්කොම කියන විදිහට නම් තිනාරා අර කොල්ලට කැමතියි.. ඒ කොල්ලා ඉස්කෝලේ ඉවර වෙන වෙලාවට එහෙම එනවා මෙයාව බලන්න.

“ඉතින්... මා ඇසුවෙමි.

“ඉතින් මෙයත් හිනා වෙවී ඉන්නවා.. මන් හිතන්නෙත් කැමති ඇති මෙයා.. එහෙම තමා දැන් කතාව යන්නෙත්.

“ම්ම් ඒකත් එහෙමද..? මා ඇසුවෙමි.

“ඔව් අයියා...

“එතකොට පොරගේ නම එහෙම මොකක්ද..? මා ඇසුවෙමි.

එවිටද ඔවුන් නම කීමට මදක් පැකිලුනි.

**“කියපන් කියපන් බන් නම.. උබලා නොදැනගන්න විදිහකුත් නැ නේ.. මා කීවේ තරහිනි.**

**“අයියා පොරගේ නම බිම්සර කියලා.. මන් හිතන්නෙ ඔයාට වඩා බාලයි..**

**“මොකක්ද උගේ ඉස්කෝලේ... මා ඇසුවෙමි.**

**“අපේ ඉස්කෝලෙම තමා අයියා..” ඔහු කීවේය.**

**“අහලා වත් නැ නේ බන්.. මා කීවේ නෝන්ඩියට මෙන්ම මගේ සිතේ ඇති වූ කෝපයත් සමහමය.**

**“මාත් නම ඇහුවට ඔය දැක්කේ පාරෙදී අයියා..” ඔහු කීවේය.**

**“ආ හරි බන් හරි.. මන් එහෙනම් ගිහින් එන්නම්කෝ කියා මා එතැනින් පිටත්ව ආවෙමි.**

**මා එතනින් පිටත්ව ගියේ අපේ පාසල දෙසටයි. වෙලාව දහවල් 1 පසුවී විනාඩි දහයක් පමණ ගොසින්ය . දැන් තවත් ටික වේලාවකින් පාසල් නිම වෙනු ඇත. මා පාසල ලගට වී සිටියහොත් ඇයව බලා ගැනීමට පුලුවනි. අනෙක අද බ්‍රහස්පතින්දා දිනකි. එදිනට ඇයට සවස් කාලයේ අමතර පන්ති ඇත. නිසැකවම ඇය අද පාසල් පැමින ඇත. ඉතින් මා ටික වේලාවක් මෙතන රැදී සිටියොත් කලකට පසුව ඇයව දැක ගත හැකිවනු ඇත.**

කෙසේ හෝ විනාඩි පහලොවක් පමණ එතන රැඳී සිටි මට ඈත තියා ඇය එනවා දකින්නට ලැබිනි.

එදා මා පළමු වරට දුටු ඇයමය. සුපුරුදු සිනාවත් සමගින් මුහුණ පුරවා ගත් ඇය ඇයගේ යහළුවා සමග මා පසු කර ගියත් මා දෙස බැලුවා හැර ඇය වෙනදා මෙන් මට සිනාසී අත වැනුයේ නැත.

එක් වරම මට එයට දුක සිතුනත් ඒ වෙලාවේ ගොඩක් ළමුන් සිටී නිසාදෝ කියා මා හිත හදාගත්තෙමි. එහෙත් එය එක් මොහොත්කට පමණක් සීමා වූයේ ඊට ඉදිරියෙන් සිටි කෙට්ටු සුදු තරමක් උස පිරිමි ළමයෙක් සමග ඇය කතා කරනවා දැකීමෙනි.

“මට අත වනලා යන්න බැරි උනාට එයාට වෙන වෙන අය එක්ක කතා කරන්න පුලුවන් නේ..

මගේ සිත මටම කීවේ ඇය ගැන මගේ සිතේ ඇති වූ පුපුරු ගසන තරහෙනි.

ඒත් සමහම මට මතකයට නැගුනේ ඇයව බලන්න එනවා කිව්ව පොඩි එකා ගැනයි. “ එහෙනම් මේ ඌ වෙන්න ඇත්ද..?

ඔව් අනිවාරෙන් මේ ඌ වෙන්න ඕනි.. මොකද ඇය නොදන්නා අය සමග වැඩි ඇසුරක් නැත.

“අහ් මට නැ නෑ කිව්වට ඔය තියෙන්නේ.. මට ඒ මොහොතේ ඇති වූයේ ඇය ගැන තරහකි.

ඇය දෙස බලා සිටි මා නැවතත් පාර දෙස බැලුවේ යාමට බස් රතයක් එනවාදැයි බැලීමටයි. සිතේ ඇති වූ දුකත් සමගම ලග ලග එනවා පෙනුනු බස් රටයක නැග ගත් මා එයට ගොඩවූයේ ඉක්මනින් ගෙදර යාමට සිතාගෙනයි

බසයේ සිට නිවස දක්වා එනතෙක්ද මට සිහි වූයේ එයයි. ඇත්තටම ඇය මාව රිද්දුවද? ඒත් ඇයි මට ඒකට දුක හිතෙන්නේ?

මේ ආකාරයේ විවිධාකාරයේ ප්‍රශ්න එක දිගට මගේ ඔලුවට එන්නට විය. ගෙදර ඇවිත් ඇදුම් මාරු කරගත් මා ඔලුවට වද දුන් ප්‍රශ්න ගොන්නත් සමගින් ඇදට වැටුනේ මදක් විවේකයක් ලබා ගැනීමටයි. නොදැනුවත්වම නින්දට වැටුනු මා නැවත අවදි වන විට වේලාව සවස හයට ආසන්න වී තිබිනි.  නිදිමතේම මා කුස්සිය වෙත ගියේ හවසට ලැබෙන මගේ තේ එක බීමට බලාපොරොත්තුවෙනි.

අම්මා ඒ වන විට තේ සාදා තිබුනු අතර පවුලේ අනිත් අය තේ බී අවසන් වී තිබිනි.

“මොකෝ අද ආපු ගමන්ම නිදා ගත්තේ..? අම්මා ඇසුවාය.

“අද හරිම මහන්සියි අම්මේ.. මා කීවෙමි.

“අහ් එහෙමද..? එහෙනම් මේ තේක බීලා ඉන්න්න.

අම්මා මට දුන්නු තේක ඉක්මනින් බිව්ව මම ඊළගට අතට ගත්තේ දූරකතනයයි. මන් එය අතට ගත්තේ තිනාරාට පණිවිඩයක් යොමු කිරීමට බලාපොරොත්තුවෙනි.

මා ඇයට පණිවිඩයක් යොමු කරේ මේ ගැනම අසායි. ඇය ඒ වෙලාවේ මගේ පණිවිඩය දැක්කත් එය බැලුවේ නැත. වෙනදා නම් මන් එවන පණිවිඩයට පිළිතුරු ලෙස ඇය එවන පණිවිඩය කිසිදු ප්‍රමාදයකින් තොරව එයි. ඒත් අද එය වෙනස් වී ඇත.

මේ වෙනස් වීම නිසා එකිනෙකා කියන කතා ඇත්ත බව මට හැගුණි. පැය බාගයකට පසු ඇය පිළිතුරක් එවා තිබිණි. මේ වරත් ඇය පැවසුයේ හුදෙක් ඇය යහලුවෙක් පමණක්ම බවයි.

එහෙත් මෙවර මා එය එතරම් පිළිගත්තේ නැත. නැවත සදුදා දින මට පන්ති තිබිනි. මට සවස් කාලයේ වැඩ වගයක් කර ගැනීම සදහා පාසලටද යාමට උවමනා විය. දැන් මා එතන සිටියොත් අදත් ඇයව හමුවේ. මදක් කල්පනා කළ මා පාසල අවසන් වන තෙක් එතන රැදී සිටීමට තීරණය කළෙමි.

ටික වේලාවක් බලා සිටි මා දැක්කේ එදා ඇය සමග කතා කළ කොල්ලායි. ඒ අසලම ශෙහාන්ද සිටියේය. මා ඒ දෙසට පිය නැගුවෙමි.

"ස් ස් .." මා ඔහුව ඇමතුවෙමි.

"ඇයි..? ඔහු එකවරම ඇසූ හැටි මට හිතට ඇල්ලුවේ නැත.

"උබද බිම්සර කියන්නේ..? මා ඇසුවෙමි.

"ඔව් අයියා.. ඇයි ඒ?

"අහ් හරි හරි.. උබ තිනාරා පස්සෙ යන එක නවත්තපන්.. මා කීවෙමි.

"නැ අයියා මන් පස්සෙන් යන්නේ නැ.. ඔහු කීවේය.

" අහ් එකත් එහෙමද..? එහෙන්ම් හොදයි.. මා කීවෙමි.

"ඔව් අයියා.. ඔහු කීවේය.

"ආ හරි හරී..මම ඔහුට කිසිත් නොකීවේ ප්‍රයොජනයක් නැති නිසායි.

එදින ඇය පාසල් පැමිණ තිබුනද මා වෙනදා නැවතී සිටිනා බස්නැවතුම්පොල පසු කර ගියේ නැත.

සමහර විට මා එදින එතැනට එන බව ඇය හොදින්ම දන්නවා විය යුතුයි. ඇය මාව මග හැරීමට එලෙස කලාද?

ඔව් එය එසේ විය යුතුයි. මන්ද ඔවුන් වෙනදාට අනිවාරෙන්ම පුරුද්දක් ලෙස මෙතැන පසු කරන් යති. එහෙත් අද මේ දෙසට ආවෙවත් නැත. මගේ හිත ඒ ගැන වද දුනි.

කමක් නැහැ.. ඒ එයාගෙ කැමැත්ත නේ මට ඒකට හරස් වෙන්නවත් එයාට බල කරන්නවත් බැහැ. මා සිතින් සිතුවෙමි.

පාසලට ගොස මගේ වැඩ ටික කරගත් මා නැවත නිවස බලා ආවෙමි. ඇග පත සෝදාගෙන දහවල් ආහාරය ගත් මා සවස් වෙන තෙක් පාඩම් කළෙමි. නැවත හවස් යාමයේ දුරකතනය අතට ගත් මා දැක්කේ මගේ හිත නැවතත් රිද්දන දෙයකි.

ඇය මාව ඇයගේ ගිනුමෙන් බ්ලොක් කර ඇත. ඒත් මන් මොකක්ද ඒ කරපු වැරැද්ද..? මොකටද එයා එහෙම කරේ.

මගේ සිත මගෙන් ප්‍රශ්න වැලක් අසයි. ඒ ප්‍රශ්න වලට මට පිළිතුරුද නැත. මා ඒ ගැන් ශෙහාන්ගෙන් විමසුවෙමි. ඇය ඔහුට මේ ගැන කියා ඇත. ඔහු මට පැවසුවේ අද දින වුන සිද්දියත් හා ඇයගේ හිතේ මා ගැන

කැමැත්තක්ද නැති බවත් ය . ඒ නිසා ඇයට පාඩුවේ ඉන්න දෙන්නත් කියා තිබිනි.

ඊට පසු දින ඇයගෙන් නැවත පණිවිඩයක් මට ලැබී තිබිනි. එවර ඇය කියා තිබුනේ ඇය බිම්සර සමග යහළු වී සිටින බවයි. ඒ පණිවිඩය දුටු විටම විශාල දුකක් හිතට ආවේ ඊරිශ්‍යාවක්ද සමගිනි. එහෙත් මා ඇයට එය පෙන්වීමට ගියේ නැත.

"ආහ් එහෙමද.. හොදයි හොදයි.." මගේ පිළිතුර එය විය.

මා එසේ කීවත් එසේ කීවේ හිතේ දහසකුත් දේ සගවාගෙනයි. එහෙත් ඒ දේවල් ඇයට පැවසීමට මට නොහැක. මෙය එයට කාලයද නෙවෙයි.

ඇයගේ මන් ආසම ලස්සන වැඩක් තිබිනි. ඇය හැමදාම රාත්‍රියට මා නොමැති උනත් රාත්‍රී සුභ පැතුමක් මට එවා නින්දට යයි. එය ඇගේ පුරුද්දකි. එහෙත් ඇය සම්පූර්ණයෙන්ම වෙනස් වූවාය. ඉස්සර දිනපතා මට නොවරදින රාත්‍රී සුභ පැතුම ආයේ ආවේ නැත.  මා ගෙවෙනා සෑම දිනක් පතාම ඇයගේ ඒ සුභ පැතුම හෝ පණිවිඩයක් එයි කියා බලා සිටියෙමි. එහෙත් එය එසේ නොවුනි.

මේ අතරතුර කාලයේදි ඇයගේ හොදම යෙහෙලිය දූ රිශිනි මට ඇය ගැන සියලු විස්තර පැවසුවාය. තිනාරා ගැන සියලු විස්තර මට කියන්නේ ඇයයි. ඒ දිනවල මගේ සිත ටිකක් හරි සැනසුවෙත් ඇයයි.

එහෙත් එක් දිනක් නැවත මට පණිවිඩයක් ඇවිත් තිබුනි. වැඩි උනන්දුවකින් එය නොබැලුවත් පණිවිඩය එවා තිබ්බෙ තිනාරායි.

ඇය අසා තිබුනේ "අයියා ඉතින් කොහොමද ? යන්නයි.

ඉන්නවා ඉතින්.. මොනවා වෙන්නද.. මගේ පිළිතුර එය විය.

මන් දන්නවා අයියා මගෙත් එක්ක තරහින් ඉන්නේ කියලා. ඒත් අයියා මන් මොනවා කරන්නද?

නෑ නෑ මගේ අති තරහක් නෑ ඔයා පාඩුවේ ඉන්න ඔයාගේ වැඩක් බලගෙන.

එදා ඒ එක පණිවිඩය මා එතෙක් කල් නොදැන සිටි දේවල් ගොඩක් දැන ගැනීමේ මුල විය.

පැය දෙකකට වැඩි කාලයක් අපි කතා කළෙමු.

ඇත්තටම මන් අයියට ආදරේ කරා ඒත් මට අතරමැදියෙක් වෙන්න බැරි නිසා මන් ඒක අයියට කිව්වෙ නැහැ. ඇය කීවේ මෙතක් කල් මට තිබුනු ප්‍රශ්නෙට පිළිතුරයි.

එදා අපි දෙන්නා හිත්වල තිබු බොහෝ දේවල් එකිනෙකාට කියා ගතිමු.

මේ සිදුවීමෙන් පසුව පෙරටත් වඩා අප එකිනෙකාට ලං වූවත් දෙදෙනාම දෙදෙනාට අහිමි බවත් හොඳින් දැන සිටිහ. එහෙත් දෙදෙනාම සිතින් දෙදෙනාට ආදරය කළහ.

දීර්ඝ කාලයක් තිස්සේ අප ආශ්‍රය කළේ ඉතාමත් ළඟිනි. එහෙත් අප දෙදෙනා එකිනෙකාට ආදරේ කරන බව අප දෙදෙනා හැර දන්නේ ඇයගේ යාලුවා පමණි. අප දෙදෙනාගේ සියළුම රහස් දන්නේත් ඇයගේ යහලුවා පමණි.

එසේ ටික කාලයක් මෙලෙස කාලය ගෙවුණි. අප දෙදෙනා ඉතා සමීපව සතුටින් කාළය ගෙවුහ. දිනක් මට හවස් වරුවක ඇය හමු වූයේ ඇයටත් පන්ති අවසන් වී බස් නැවතුම්පොලෙහි සිටියදී යි. ඇය සිටියේ රෂිනි සමගයි. ඔවුන් දෙදෙනා ගොඩ වූ බස් රියටම මාත් නැග ගත්තෙමි. ඔවුන් වාඩි වී සිටියේ ආසන තුනක් ඇති අසුනකයි. එතැනින් එක් ආසනයක් හිස් නිසා මා එතැනින් ඉඳ ගත්තෙමි.

ඇය සිටියේ ජනේලය අයිනට වන්නටයි. ඇයගේ යහලුවා මැදත් මා අනෙක් කොනේත් සිටියෙමි. ටික දුරක් කිසිත් කතා නොකරම අපි ගියෙමු. එක් වරම ඇයගේ යහලුවා මගෙන් අසුවේ සතුටු හිතෙන ප්‍රශ්නෙකි.

අයියා එයාව මෙතෙන්ට දාලා මන් කොනට යන්නද ? ඇය ඇසුවාය.

“එයා යන්නේ නැති වෙයි නංගී..” මා කීවෙමි.

“නෑ නෑ අපි කියලා බලමුකෝ..” ඇය කීවාය.

කෙසේ හෝ අවසානයේ ඇය මා ළගට මාරු උනාය. මට ඇති වූයේ ඉමහත් සතුටකි. ඇය මා ළගට ආවත් කතා කලේ හෝ නැත. එදා මා හා ඇය එතරම් ලගින් සිටි පළමු දිනයි. ඇය මගේ මුහුණ දෙසවත් නොබලා සිටියේ ඇයගේ ලැජ්ජහවටය.

ඇයගේ යහළුවා වූ රෂිනි ටික වේලාවකින් බහින තැන ළගා වූ නිසා අපට සමු දී ගියාය.

එවිට අප සිටි ආසනයේ සිටියේ ඇයත් මමත් පමණි. ටික වෙලාවක් කතා කර කර සිටි අප දෙදෙනාම කතා කලේත් චකිතයකිනි.

මම සෙමින් ඇගේ අත මගේ අතින් අල්ලා ගතිමි. එය ඉතා සිනිදු අතක් විය. මා ඇයගේ අත ඇල්ලුවේද හිතේ වූ යම්කිසි බියෙකිනි. එහෙත් ඇය කිසිත් නොකීව නිසා මාද ඇයගේ අත තදින් අල්ලාගෙන සිටියෙමි.

අප එසේ ටික වේලාවක් ආවෙමු. එහෙත් ඒ වේලාව දැනුනේ එක් නිමේශයක් මෙනි. ඇයගේ ඒ අල්ලාගත් අත නැවත අත හරින්නට මට ලෝබ සිතුනි. අපේ ඒ සුන්දර මොහොතට කාලය හරස් විය. මට සිතුනේ එකම එක දෙයක් පමණි. ඒ අනේ තව ටිකක් වෙලා තිබ්බා නම් යන සිතුවිල්ල පමණි. ඇය නැගිට යාමට සැරසෙද්දි ඇයගේ කම්මුල මා සිප ගත්තේ ඇයව මොහොතකට නතර කරමිනි.

ආපසු මා දෙස බැලූ ඇය පරිස්සමෙන් යන්න අයියා කියා නික්මුනේ ගත වූ සොදුරු විනාඩි කිහිපයක අවසානය සනිටුහන් කරමිනි.

අනෙක් පස ජනේලය ළග හිද ගත් මා ඇය ඇත යන දෙස ඇයව නොපෙනී යන තෙක් බලා සිටියෙමි.

නැවත ටික කාලයක් ඇයත් මමත් හොඳින් සිටියත් එය එසේ වෙනවාට ධෛවය කැමති නැති විය. ඇය සිතා හෝ නොසිතා මාව රිද්දූවාය. එය දරාගත නොහැකි තැන මා ඇයගෙන් ඉවත් උනෙමි.

ඒත් කොහොමද එහෙම ඉන්නේ..? නිතරම මගේ සිත මගෙන්ම අසයි.

මා ඇයව අමතක කර ජීවත් වන්නට තීරණය කළෙමි. එය බොහෝ අමාරු වැඩක් වුවත් එය කළ යුතුම විය. ඒ දිනවල වෙනදා මෙන් ඇයගෙන් එන පණිවිඩ දිනපතා ඇය මට කියන දවසේ විස්තර ඒ කිසිම දෙයක් නැත. දින සති ගෙවුනත් ඒ ගෙවුනේ ජීවිතයේ මා ගෙවූ ඉතාමත් අමාරු දුක්බර කාලයක් පමණක් යන්න මා හට හොඳින්ම වැටහුණි.

ඇයි මට එයා නැතුව ඉන්න බැරි? ඒ තරමට අපි දෙන්නා අතර තිබ්බ සම්බන්ධෙ මොකක්ද? මගේ ජීවිතේ එයා මගේ කවුද? මන් එයාගේ කවුද?

අපි අපේ කාගෙවත් කවුරුත් නෙවෙයි. ඒක අපි දෙන්නම හොඳින්ම දන්නවා. ඒත් අපි දෙන්නටම බෑ අපි අමතක කරලා ඉන්න ඒකයි ඇත්ත. සිත සමග මා තනිවම මගේ ප්‍රශ්න වලට පිළිතුරු බැන්දෙමි.

මේ කාළයේ මා මානසිකව බොහෝ සෙයින් දුර්වලවත් පීඩාවටත් පත් වී සිටියෙමි. මා හට මේ ප්‍රශ්නය තදින් බලපෑවේය. මේ ප්‍රශ්නය ගැන හොඳින්ම දන්නා හා මට මේ ප්‍රශ්නය විසඳා ගැනීමටත් මගේ සිත ටිකක් හෝ සැනසීමටත් සිටියේ එකම එක කෙනෙකි. ඒ තිනාරාගේ හොඳම යහළුවායි. රිශිනියි.

ඇය මගේ ප්‍රශ්න වලටත් කෙසේ හෝ උත්තර දෙන ගමන් තිනාරාගේ සියළු විස්තර මට පැවසුවාය. එක් අතකින් එවන් කෙනෙක් මේ මොහොතේදී මට උදවු වීම මට මහත් රුකුලක් විය.

ඇය දිනපතා තිනාරා ගැන සියළු තොරතුරු මෙන්ම ඒ ඒ දිනයේදි සිදු වූ දේවල් අකුරක් නෑර මට කීවාය.

මේ දින වලදී ඇයට පණිවිඩයක්වත් නොයවා සිටීමට මා කටයුතු කටයුතු කළෙමි. නිතරම සිත කීවේ ඇයට කතා කරන ලෙසයි. එහෙත් ඇයට තව දුරටත් වදයක් වීම තේරුමක් නැති වැඩක් බව ඒ වන විට මට හොඳින් වැටහී තිබුනි.

එහෙත් එක් දිනක් හදිසියේම ඇයගෙන් මට පණිවිඩයක් ඇවිත් තිබුනි. ඇය මට කෙසේද හොඳින් ඉන්නවද වගේ දේවල් ඇසුවාය. මාත් ඒවාට උත්තර දුන් අතරම ඇය ඒ ටික කාලයට සම්පූර්ණයෙන්ම වෙනස් වී සිටියාය්.

ඇය සිතන්නේ මා ඇය ගැන හොයලා නොබැලුවේ ඇය සමග තරහින් ඇයව අමතක කරපු නිසා කියායි. නමුත් ඇත්ත නම් ඇගේ ජීවිතේ ප්‍රශ්න වලට හේතුව මා වීමයි.

එදා රාත්‍රියේත් කලකට පසු අප දෙදෙනා බොහෝ දේ කතා කල අතර ඇයට එක් දෙයක් මට ලබා දීමට ඇති බවත් එය ඇයගේම අතින් ලබා දිය යුතු නිසා ඇයව හමුවීමට පුළුවන්ද යැයි මගෙන් ඇසුවාය.

ඇයව හමුවීමට තීරණය කළ මා පසු දින ඔවුන්ට පන්ති ඉවර වන වේලාවට අප කතා කර ගත් තැනදී මුණගැසුනෙමු.

ඇය එනතෙක් මා මග බලන් සිටියෙමි. ඇය පැවසූ පරිදිම ඒ වෙලාවටම එතැනට ආවාය. මගේ මුහුණ දෙස බලන් සිටි ඇය ඇගේ බෑගයෙන් එළියට ගත්තෙ ලියුම් කවරයකි. එහි පිටත ඇයගේ නම ලියා තිබිනි.

එය මට දුන් ඇය එය තියා ගන්නා ලෙස කීවාය. පසුව එය මගේ බෑගය තුළට දා ගත් මා ඇයත් සමග බස් නැවතුම්පොළට ගියෙමි.

එතැනදී ඇයගේ අනෙක් යහළුවෝ සමගින් ඇය බසයකට නැග්ගාය. මාත් ඒ බසයටම නැග ඇය අසළින් වාඩි උනෙමි. ඇය එදින වැඩි කතා බහක් නොතිබූ අතර ජනේලයෙන් ඉවත බලාගෙනම යන්නට ගියාය.

ඇයගේ අත තදින් අල්ලා ගත් මා ඇය සමග එදින් ඒ මොහොත ගත කළේ නැවත කිසිදා එවන් මොහොතක් නොයෙන බව හැගුණු නිසායි.

ඒ මොහොතේ මන් ඇයගෙන් ඇසූ එකම දේ නම් කවදාවත් මාව දාලා යන්නේ නැ නේද යන්නයි.

ඇය එයට උත්තර දුන්නේ “නැහැ” යන්න වුවත් මගේ සිත එයට එකග නොවුනි.

එදිනත් කාලය ඉතාමත් වේගයෙන් ගොස් ඒ මොහොතට සමු දීමට සිදු වන්නට විය. ළග ඉන්නම සිතුනත් ඇත්ත නම් ඇයට මා ළග නැවතිය නොහැක. ඉතින් ඇයට කළ හැක්කක් නොමැත. ඇය බැස යන තෙක් බලා සිටි මම ඇය දුන් ලියුම විවුර්ත කළෙමි.

එය දිග හැර බැලූ මට දැක ගන්නට ලැබුනේ ලොකු කොළ තුනක පමණ ලියුමකි. මා එතෙක් කල් නොදැන සිටි බොහෝ කතා බෝහෝ දේ ඒ ලියුමේ සදහන් වී තිබිනි.

එය කියවූ මට ඇති වූයේ මහත් දුකක් මෙන්ම ඇය ගැන අනුකම්පාවකි. ඇය එච්චරම මට ආදරේ කරනවා නම් මාත් ඇයට ආදරේ කරනවා නම් ඇයි අපිට එකතු වෙන්නට බැරි? මා මගෙන් ප්‍රශ්න කළෙමි.

එය අපිට උරුම හැටි වෙන්නැති.. බොහෝ සැබෑ ආදරවන්තයන් සියළු දෙනාටම එකතු වීමට හැකියාවක් නැත. මෙයත් එවන් කතාවක් විය හැක. මා මගේ ප්‍රශ්න වලට සිතින් උත්තර බැන්දෙමි.

එදායින් දින දෙකකට පමණ පසුව මේ සියල්ල නිසා ඇයට විවිධ ප්‍රශ්න එන්නට විය. ඇය එය මට එදින මුහුණටම පැවසුවාය. හදවත පාසාරු කරන තරම් දුකක් එදා මට ඇති විය. එහෙත් කළහැක්කක් නොමැත බලා සිටිනවා හැර. තව දුරටත් හිතේ හැඟීම් වලට ඉඩ දී හිටියොත් හැමදාමත් ඇය ප්‍රශ්න වලින් බැට කනු ඇත.. ඉතින් හොදම දේ නම් මා ඇයගේ ජීවිතෙන් ඉවත් වීමයි.

ඒ තීරණය එදා මා දැඩිව ගත්තෙමි. එහෙත් ගෙවෙන හැමදවසකම ඇය ගැන සියල්ල මා සොයා බලමි. ඇයගේ සිතේ මා ගැන කුමන ප්‍රතිරූපයක් ගොඩ නැගුනද එය මට ප්‍රශ්නයක් නොවේ. ඇය හැමදාමත් මගේ හදවතේ ජීවත් වනු ඇත. එහෙත් ඇයට ඇයගේ සිතේ මා වෙනුවෙන් ඉඩක් වෙන් කිරීමටවත් මගේ ජීවිතයට පැමිණීමටවත් නොහැක. ඉතින් මා ගත යුතු හොදම පියවර මෙයයි.

කාලයත් සමග ඔබට මාව අමතක වෙවි. එහෙත් මා සමග ගෙවුනු කාළය ඔබට අමතක නොවනු ඇත.. හැකි තාක් මතක සමග ජීවත් වන්න.. මන්ද මතක ඔබව ජීවත් කරනු ඇත..

කවදාක හෝ ඔබ ලැබේ යැයි යන සියුම් බලාපොරොත්තුව සමග අවසානයක් නොමැති කතාවක අවසානයක් සනිටුහන් කරමි..

*අවසන් වරට මගෙන් ඇය වෙත: හැමදාමත් පරිස්සමින් ඉන්න.. බුදු සරණයි!*



ලොවක් නිසල වූ රාත්‍රිය ය..

නැතය මනරම් මා හට

හදේ ඉකිබිඳුම් ස්වර නගත්ම

ඔබ ඒවි සෙමින් මා සිතට

ලයෙහි එක තුවාලයක් වී නම්

ඒ ඇයගේ රුවමය

සෙනෙහෙය පිරී ගිය ගල් සිත තුළට

ඇයිද නොබැස්සේ සියුමැලිය

දෙහිතකට ආදරය පිරුණු ඔබේ සිත

කෙතරම්ම බෝසත්ද...

(රිසිනි කෝන්නාර)

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයක් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවක් සාහිත්‍යය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ නම් නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාශිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්



යළි කිසිදා ඔබ හමු නොවන බව මා දනිමි...

ඔබට මට වඩා ඔබ ප්‍රේම කරන ආදරනීය පෙම්වතෙක් සිටින
බවත් ඔබේ සිත ඔහු ළඟත් මා හොඳින් දනිමි..

ඉතින් සොදුරිය මීට වඩා තවත් දේවල් කුමකට ද?

ඔබේ ජීවිතෙන් මා නික්ම යාමට කාළය පැමිණ ඇත. මෙතෙක්
කල් මා ලගින් සිටියාට ඔබට තුති පුදමින්.. ඔබේ මතකයන්
ගොන්න මා හද තුල සිර කර ගනිමින් මා නික්මෙමි..

මීට (:) නුබේ සිතට  අයිතිවාසිකම් කියූ ඉරිසියාකාර පෙම්වතා